# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 243/48 — 1976 දෙසැම්බර් 17 වැනි සිකුරාදා — 1976.12.17

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

ජනා. කා. අංකය: ඩබ්ලිව්. 68 (70)/76.

### 1976 අංක 12 දරන හදිසි අවස්ථා (විවිධ විධිවිධාන හා බලතල) නියෝග

1976 අංක 12 දරන හදිසි අවස්ථා (විවිධ විධිවිධාන හා බලතල) නියෝගවල 18 වන නියෝගයෙහි (5) වන ඡෙදය යටතේ ජනාධිපතිවරයා විසින් සාදනු ලබන රීති.

වි. ගොපල්ලව,
ජනාධිපතිවරයා

1976 දෙසැම්බර් මස 17 වැනි දින,
කොළඹ 1,
ජනාධිපති කාර්යාලයේ දී ය.

### රීති

1. 1976 අංක 12 දරන හදිසි අවස්ථා (විවිධ විධිවිධාන හා බලතල) නියෝගවල 18 වෙනි නියෝගයෙහි (1) වෙනි ඡෙදය යටතේ ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් විසින් යම් තැනැත්තකු සම්බන්ධයෙන් ආඥාවක් කරනු ලැබ, එය ක්‍රියාවේ යොදවනු ලැබූ අවස්ථාවක, ඒ නියෝගයෙහි කාර්යයන් සඳහා පත් කරනු ලැබූ යම් උපදේශක කාරක සභාවක සැලකිල්ල සඳහා ඒ ආඥාවට විරුද්ධව ලිඛිත විරුද්ධතාවන් ඒ ආඥාව ක්‍රියාවේ යොදවනු ලැබූ දිනයෙන් පසු 20 දිනක් ඇතුළත ඔහු විසින් ඉදිරිපත් කළ හැකිය.

2. 1 වෙනි රීතියේ සඳහන් කරනු ලැබූ ලිඛිත විරුද්ධතාවන් ජනාධිපතිවරයාගේ ලේකම්ගේ කාර්යාලයට ලියාපදිංචි කළ තැපැලෙන් එවීම හෝ භාරදීම කළ හැකිය.

3. උපදේශක කාරක සභාවක සැලකිල්ල සඳහා යම් විරුද්ධතාවන් ඉදිරිපත් කරන හැම තැනැත්තකුටම, ඒ කාරක සභාව විසින් ඔහුගේ විරුද්ධතාවන් සැලකිල්ලට භාජන කරනු ලබන අවස්ථාවෙහි, ඒ කාරක සභාව ඉදිරියෙහි පුද්ගලිකව පෙනී සිටීමට හෝ නීතිඥයකු විසින් හෝ එවැනි තැනැත්තකු විසින් නිසියාකාර බලය පවරනු ලැබූ වෙනත් නියෝජිතයකු විසින් නියෝජනය කරනු ලැබීමට හිමිකම් තිබිය යුතුය.


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

111A——ඒ 24292—2,100 (76/12)